00791

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව)

උපාධි වැඩසටහන- 3වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

**EPU3533- විෂයමාලා අධ්‍යයනය සහ ප්‍රායෝගික වැඩ-ගණිතය**

කාලය - පැය තුනයි. (03)

දිනය - 2025.05.30 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගන්නා ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 01 - වන කොටස

01. ගණිතය වැදගත් විෂයක් ලෙස සලකන්නේ ඇයි?

02. ගණිතයේ දියුණුව සඳහා යුරෝපීය දායකත්වය සඳහන් කරන්න.

03. ප්‍රාථමික මට්ටමේ ගණිතය ඉගැන්වීම සඳහා ක්‍රමවේද තෝරා ගැනීමේදී ඔබ සළකා බැලිය යුතු වැදගත් සාධක ලැයිස්තුගත කරන්න.

04. පෙර පාසල් අත්දැකීම් ගණිතය ඉගෙනීමට දක්වන දායකත්වය සාකච්ඡා කරන්න.

05. "ඉගෙනුම් ශෛලිය" යන යෙදුමෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

06. ගණිතය ඉගැන්වීමේ දී ගුරුවරයාගේ ප්‍රත්‍යාවේක්ෂණය (Reflections) ඉතා වැදගත් වන්නේ ඇයි?

07. "සමවයස් ඉගෙනුම" යන පදය පැහැදිලි කර එහි වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරන්න.

08. "සම්භවන තක්සේරුව" යන පදය නිර්වචනය කරන්න.

(ලකුණු 05 X 08 =40)

09. I. ප්‍රාථමික පාසල් සිසුන් අතර දක්නට ලැබෙන ගණිත ඉගෙනීමේ දුෂ්කරතා වර්ග තුනක් (03) පැහැදිලි කරන්න. එක් එක් දුෂ්කරතාවයේ ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 )

II. ප්‍රාථමික පාසල් සංදර්භය තුළ ගණිතය ඉගෙනීමේ දුෂ්කරතා ඇතිවිය හැකි හේතු හතරක් (04) සාකච්ඡා කරන්න. පන්තිකාමර තත්ත්වයන්ට අදාල උදාහරණ සපයන්න. (ලකුණු 08 )

III. ප්‍රාථමික පාසල් සිසුන්ගේ ගණිතය ඉගෙනීමේ දුෂ්කරතා විසඳීම සඳහා ගුරුවරුන්ට භාවිතා කළ හැකි සුදුසු මැදිහත්වීමේ උපායමාර්ග දෙකක් (02) තෝරා ඒවා පැහැදිලි කරන්න.
එක් එක් උපායමාර්ගය සඳහා

- දුෂ්කරතාවයෙන් මිදීමට එය උපකාර වන ආකාරය විස්තර කරන්න.
- පන්තිකාමරය තුළ එහි භාවිතය පිළිබඳ උදාහරණයක් සපයන්න. (ලකුණු 06 )

10. I. පෙර පාසල් සහ ප්‍රාථමික පාසල් අවධියේ දී ගණිතමය නිපුණතා ඇගයීමේ වැදගත්කම පැහැදිලි කරන්න. ඔබේ පිළිතුරට සුදුසු පැහැදිලි කිරීම් සමඟ අවම වශයෙන් ප්‍රධාන හේතු තුනක් (03) ඇතුළත් විය යුතුයි.
(ලකුණු 06 )

II. ප්‍රාථමික පාසල් සිසුන්ගේ ගණිතමය නිපුණතා ඇගයීමට භාවිතා කළ හැකි ක්‍රම හතරක් (04) විස්තර කරන්න.

- කෙටි පැහැදිළි කිරීමක් සපයන්න.
- පන්ති කාමර සැකසුමක එය යෙදිය හැකි ආකාරය පිළිබඳ උදාහරණයක් සපයන්න. (ලකුණු 08 )

III. ගණිත ගුරුවරයෙකු ලෙස, සමහර සිසුන් මූලික සංඛ්‍යා කර්ම සමඟ ගැටළු ඇති කරන බව නිරීක්ෂණය කරයි. මෙම සිසුන්ගේ ගණිතමය ඉගනීම ඵලදායි ලෙස තක්සේරු කර සහාය වීම සඳහා ඔබ ක්‍රියාත්මක කරන උපාය මාර්ග දෙකක් (02) යෝජනා කරන්න.
එක් එක් උපාය මාර්ගය සඳහා උදාහරණ සපයන්න. (ලකුණු 06 )

11. I. ප්‍රාථමික ගණිතයේ සංදර්භය තුළ ඉගෙනුම්- ඉගැන්වීම් ආධාරක නිර්වචනය කරන්න. ගණිතමය සංකල්ප පිළිබඳ සිසුන්ගේ අවබෝධය වැඩි දියුණු කිරීමේ දී ඒවායේ වැදගත්කම පැහැදිලි කරන්න.
(ලකුණු 05 )

II. ප්‍රාථමික ගණිත පන්තිකාමර වල බහුලව භාවිතා වන ඉගෙනුම්- ඉගැන්වීම් ආධාරක වර්ග හතරක් (04) විස්තර කරන්න. නිශ්චිත ගණිත සංකල්පයක් ඉගැන්වීම සඳහා එක් එක් ආධාරක භාවිතා කළ හැකි ආකාරය පිළිබඳ උදාහරණයක් සපයන්න. (ලකුණු 08 )

III. ප්‍රාථමික මට්ටමේ සංඛ්‍යා ඉගැන්වීම සඳහා ගුරුවරයෙකුට සංවර්ධනය කළ හැකි අඩු වියදම් හෝ වියදම් රහිත ඉගෙනුම්- ඉගැන්වීම් ආධාරකයක් යෝජනා කරන්න. එය සකස් කිරීමේ පියවර පැහැදිලි කර පන්ති කාමරය තුළ ඔබ එය භාවිතා කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 07 )

12. I. පෙර පාසල් මට්ටමින් හඳුන්වා දී තිබෙන වැදගත් ගණිතමය සංකල්ප පහක් (05) ලැයිස්තුගත කර කෙටියෙන් පැහැදිලි කරන්න. මෙම සංකල්ප දරුවන් තුළ මුල් අවධියේ දී සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය ඇයි? (ලකුණු 06 )

II. ප්‍රාථමික පාසලේ ගණිතය ඉගැන්වීමේ අරමුණු සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 07 )

III. ප්‍රාථමික පාසලේ උගන්වන ඕනෑම එක් වැදගත් ගණිත සංකල්පයක් තෝරන්න. සිසුන්ට සුදුසු ක්‍රියාකාරකම් පාදක ප්‍රවේශයක් භාවිත කරමින් ඔබ මෙම සංකල්පය උගන්වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 07 )

13. I. පහසුකම් සපයන්නෙකු ලෙස ගුරුවරයෙකු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී වැදගත් භූමිකාවන් හතරක් (04) ඉටු කරයි. මෙම භූමිකාවන් හතර (04) ලැයිස්තුගත කර සුදුසු උදාහරණ සමග එක් එක් භූමිකාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 )

II. තුන්වන ශ්‍රේණියේ සිසුන් සඳහා "දිග මැනීම" පිළිබඳ පාඩමක් සැලසුම් කරන්න. පාඩම අතරතුර ඔබේ සිසුන් ක්‍රියාශීලීව සම්බන්ධ කර ගැනීමෙන් ඔබ ඉගෙනීමට පහසුකම් සපයන ආකාරය විස්තර කරන්න.ඔබ භාවිත කරන ඉගැන්වීමේ උපාය මාර්ග, ක්‍රියාකාරකම් සහ ඉගෙනුම්-ඉගැන්වීම් ද්‍රව්‍ය සඳහන් කරන්න.

(ලකුණු 12 )

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*